1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல / My Ref. | CSS/03/06/ANN.TR/2025(59) | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2025.06. 20 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>වාර්ෂික ස්ථාන මාරු - 2025</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ ඇමතු මාගේ අංක CSS/03/06/ANNT.TR/2025(09) හා 2025.02.05 දිනැති ලිපිය හා බැදේ.

02. ඒ අනුව, උක්ත යොමු ලිපිය මඟින් නිකුත් කරන 2025.02.05 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 01/2025 හි 2.1 ඡේදය යටතේ දකුණු පළාත් ප්‍රධාන ලේකම් පත්වීම් බලධරයා වන තනතුරුවල වාර්ෂික ස්ථාන මාරු 2025.07.01 දින සිට ක්‍රියාත්මක බවට විධිවිධාන දක්වා ඇත.

03. නමුත්, 2025 වර්ෂයේ පළාත් පාලන ආයතන සඳහා සභිකයන් තෝරා ගැනීමේ ඡන්ද විමසීමේ කටයුතු සඳහා නිලධාරීන් නියුක්ත වීම ඇතුලු තවත් කරුණු කිහිපයක් හේතුවෙන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ කටයුතු නියමිත කාල සටහන තුළ සිදු කිරීම ප්‍රමාද වී ඇත.

04. කෙසේ වෙතත් මේ වන විට වාර්ෂික ස්ථාන මාරු කමිටු මඟින් අදාළ කටයුතු සිදු කරමින් පවතින අතර, කඩිනමින් එකී ස්ථාන මාරු තීරණ නිකුත් කිරීමට මෙම කාර්යාලය මඟින් කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

05. ඒ අනුව, 2025.07.01 දිනට ක්‍රියාත්මක වීමට නියමිතව තිබූ ස්ථාන මාරු ක්‍රියාත්මක වන දිනය ඉදිරියේදී දැනුම් දීමට කටයුතු කරන බව තවදුරටත් දන්වා සිටිමි.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"